www.kidworship.kr

# මෝසෙස් 1

– 14th Story–



95Page

පොතේ ගුරා ඉශ්‍රායෙල්වරු අවුරුදු 400 ක් මිසරයේ සිටියා. මිසරයට ජීවත් වෙන්න ආපු ඉශ්‍රායෙල්වරු දෙවියන්වහන්සේගේ අනුග්‍රහයෙන් බෝවී වැඩි වෙමින් සිටියා. ඉශ්‍රායෙල්වරුන් මිසරයේ වර්ධනය වෙන්න වෙන්න ඊජිප්තුවේ රජතුමා ඔහුන්ට බය වුණා.

ඵාරාවෝ දැන් ඉශ්‍රායෙල් සෙනඟගේ ගණන අපගේ සෙනඟගේ ගණනට වඩා බොහෝම වැඩියි. දැන් යුද්ධයක් ඇති වුණොත් එහෙම ඉශ්‍රායෙල්වරු අපිව පරාජය කරයි.

පොතේ ගුරා මේ හේතුවෙන් ඵාරාවෝ ඉශ්‍රායෙප්වරුන්ට  බර වැඩ දෙමින් වද හිංසා කරමින් ඔවුන්ව වහලුන් සේ තබාගත්තා.

ඊජිප්තු මිනිසෙක් ඉක්මන් කරන්න. ඉක්මන් කරන්න. අපිට තව ගඩොල් ඕන. මොනවද උඹ කරන්නේ ඔතැන ? හා... හා හා... නැගිටපන් නැගිටපන්.


ඉශ්‍රායෙල් මිනිසෙක් ආහ්... ඌයි... ( කෑ ගහයි )

කාන්තාවක් ස්වාමිනී, අපිව බේරගන්න. ඊජිප්තුවෙන් අපිව බේරගන්න.

පොතේ ගුරා ඉශ්‍රායෙල්වරුන්ට ඊජිප්තුවේ වහලුන්ව සිටිය දී කිසිම විවේකයක් ගන්න වෙලාක් තිබුණේ නෑ. ඊජිප්තුවරුන් ඔවුන්ට විධාන කරන හැමවිටම ඔවුන්ට තද බර වැඩ කරන්න වුණා.
මේ ආකාරයෙන් ඊජිප්තුවරුන් කොපමණ ඉශ්‍රායෙල්වරුන්ට කරදර කළත් ඉශ්‍රායෙල්වරු ගණනින් වැඩී වර්ධනය වුණා.

..............................................................................................

පොතේ ගුරා එක් දවසක් ඵාරාවෝ රජ වින්නඹු කානත් ාවන්ට කතා කළා.
වින්නඹුවන් යනු කානත්‍ා දරු ප්‍රසූතියේ දී උපකාර කරන්නා වූ පිරිසකි.



96Page

ඵාරාවෝ නුඹලා වින්නඹුකම් කරන විට ඉශ්‍රායෙල් කාන්තාවෝ දුවරු ප්‍රසූත කළොත් ඔවුන් ජීවත් වුණාවේ, නමුත් පිරිමි දරුවෝ ප්‍රසූත කළොත ්ඔවුන් නයිල් ගඟට විසි කරපල්ලා.

පොතේ ගුරා එහෙත් මේ වින්නඹු කාන්තාවෝ දෙවියන්වහන්සේට බය වූ නිසා මිසරයේ රජු දුන් ආඥාව ලෙස නොකොට පිරිමි දරුවන් නොමරා ඉතුරු කළෝය. ඒ නිසා දෙවියන්වහන්සේ වින්නඹුවන්ට ආශිර්වාද කළ සේක. ඉශ්‍රාය-ල්වරු සදාකාලික වහල්ලු ලෙස තබා ගැනීමට ඵාරාවෝ රජුට වුවමනා වුවත් ඉශ්‍රායෙල්වරුලේ යාච්ඥා සහ කන්නලව් ඇසූ දෙවියන්වහන්සේ ඔවුන්ව මුදවා ගැනීමට තීරණය කළ සේක.

..............................................................................................



97Page

පොතේ ගුරා එක්තරා දවසක දී ඉශ්‍රායෙල් කාන්තාවක් පුතෙකු ප්‍රසූත කළා.
ඒ පුතා හරිම ලස්සන ශෝභමාන දරුවෙක්. දැක්ක ගමන් ආස හිතෙනවා.
මේ දරුවා නයිල් ගංගාවට විසි කරන්න, මේ අම්මා කැමති වුණේ නෑ.
ඒ නිසා මේ ස්ත්‍රී තමන්ගේ දරුවා තුන්මසක් සඟවා ගත්තා.
ඒත් මේ දරුවා වැඩී වර්ධනය වත්ම, හඬන ශබ්දය වැඩිවත්ම තවදුරටත් දරුවා සඟවා තබා ගැනීම දුෂ්කර වුණා.

අම්මා ස්වාමිනි මගේ දරුවා ආරක්ෂා කර තබා ගන්න.

පොතේ ගුරා මේ දරුවගේ මව, ඉතා උනන්දුවෙන් දෙවියන්වහන්සේට යාච්ඤා කළා. තවදුරටත් ඔහු සඟවා ගැනීමට නොහැකි වූ කල්හි ඈ, පන් පෙට්ටියක් ගෙන ඒකේ කීල් සහ ලාටු ගා දරුවා එහි තබා ගං ඉවුරේ පන් ගස් අතරේ තැබුවා.

.......................................................................................



98Page

පොතේ ගුරා මේ දරුවගේ සහෝදරිය නම මීරියම්. ඇය මේ දරුවාට කුමක් වන්නේ ද කියා දැන ගන්න පිණිස දුරින් සිට බලා සිටියා. පන් පෙට්ටිය සහිත දරුවා නයිල් ගංගාව දිගේ පාවීගෙන ගොස් ඵාරාවෝ රජුගේ දුව ස්නානය කරන ස්ථානයට ළඟා වුණා. ඵාරාවෝගේ දුව මේ පෙට්ටිය දුටුවා.

කුමාරිකාව අර පෙට්ටිය මට ගෙනත් දෙන්න. අනේ...! මේ හෙබ්‍රෙව් දරු පැටියෙක්. මොනවද අපි මෙයාට කරන්නේ ?

පොතේ ගුරා මේ වෙලාවේ මීරියම් ඵාරාවොගේ දුව ළඟට ඉතා ඉක්මනින් ආවා.

මීරියම් කුමාරිකාවනි, ඔබ උදෙසා දරුවාට කිරි දෙන්න, මම ගිහින් හෙබ්‍රෙව් කිරි මවක් කැඳවාගෙන එනන්ද ?

කුමාරිකාව ඔව් ! ඔයාට ඒක කරන්න පුලුවන් ද ? හා යන්න.

පොතේ ගුරා මීරියම් ඉතා මහත් ප්‍රීතියෙන් ගෙදරට දුවගෙන ගියා.

මීරියම් අම්මා, ඵාරාවෝගේ දු කුමාරිකාවට අපේ බබා හම්බවුණා. කුමාරිකාව බබාව බලාගන්න කෙනෙක් හොයනවා. අම්මා දැන්ම ඔයා යන්න ඕන.

අම්මා මොකක් !! මේක ඇත්තක් ද ? ඕහ්... ස්වාමිනි ඔබට ප්‍රශංසා වේවා !


පොතේ ගුරා දරුවගේ අම්මා ඵාරාවොගේ දුව සිටින ස්ථානයට දුවගෙන ගියා. එහෙත් ඇය මේ දරුවා නොදන්නා ආකාරයෙන් හැසිරුණා.

කුමාරිකාව මේ දරුවා ගෙන ගොස්, මා උදෙසා කිරි දෙන්න. මම නුඹට කුලී දෙන්නම්.

අම්මා ඔව් කුමාරිකාව, මම ඒක කරන්නම්.

පොතේ ගුරා මේ ආකාරයෙන් මේ දරුවා තමන්ගේම අම්මා යටතේ හැදී වැඩෙන්නට දෙවියන්වහන්සේ මැදිහත් වුණා. උන්වහන්සේම ඔවුන්ට උපකාර කළා.

.......................................................................................



99Page

පොතේ ගුරා ඵාරාවොගේ දුව මේ දරුවට මෝසෙස් කියා නම තැබුවා. එහි තේරුම " ඔහු වතුරෙන් ඇදගත් නිසා ". මෝසෙස් ශක්තිමත් සහ නිරෝගමත් දරුවෙක් විදිහට වැඩී වර්ධනය වුණා. මෝසෙස්ට තේරුම්ගත හැකි වයස පැමිණෙන විට මෝසෙස්ගේ අම්මා ඔහුට සියලු සත්‍ය තේරුම් කර දුන්නා.

අම්මා ඔයා ඵාරාවොගේ පුතා තමා. එහෙත් මෝසෙස් ඔයා ඉශ්රායෙල් ජාතිකයෙක්. ඔයා රජමාලිගාව තුළ ජීවත් වුණත්, ඔයා ඉශ්රායෙල්වරුන් වහලුන් විදිහට විඳින දුක් වේදනාව කවදාවත් අමතක කරන්න එපා.

පොතේ ගුරා මෝසෙස්ගේ මව, මෝසෙස් අනාගතයේ දී දෙවියන්වහන්සේට සේවය කළ යුතු ආකාරය කියා දුන්නා. මෝසෙස් ඵාරාවොගේ රජමාලිගාවේ අනිකුත් කුමාරයන් සමඟ, ඵාරා-වොගේ දුවගේ පුත්‍රයා ලෙසින් ජීවත් වුණා. ඔහු සියලුම ශිල්ප ශාස්ත්‍රය හදාරමින් උතුම් තරුණයෙක් ලෙස වර්ධනය වුණා.



100Page

| | |
|---|---|
| පොතේ ගුරා | අතිතයේ මොසෙස් තුමා ඉශ්රායෙල් ජනයන්ව ඔහුගේ නායකත්වය යටතේ ඊජිප්තුවෙන් බේරාගෙන පොරොන්දු දේශයට ගෙන එන ලදි. |
| වහල්ලු | අපි දැන් නිදහස් අය. අපි තවදුරටත් වහල්ලු නෙවෙයි. |
| පොතේ ගුරා | ඉශ්රායෙල්වරු ගොඩාක් සතුටු වුණා. ඔවුන් මෝසෙස් සමඟ නිර්භීතව ගමන් කළා. දෙවියන්වහන්සේ මිසරයේ දුක් විඳීමෙන් ඉශ්රායෙල් සෙනඟ ගලවා ගත්තා. ඉශ්රායෙල් සෙනඟ දෙවියන්වහන්සේට නමස්කාර කරන්නත් උන්වහන්සේ සමග සිටින්නත් පුලුවන් වූ නිදහස් සෙනඟක් වුණා. |
| | ........................................................................................ |
| ජීවිතයට අදාල කිරීම | දුවේ පුතේ, දෙවියන්වහන්සේ උපතේ සිට මහ පුදුම ලෙසින් අපිව ආරක්ෂා කර තිබෙනවා.<br>උන්වහන්සේට අපි ගැන සැලැස්මකුත් තිබෙනවා.<br>ඒ ගැන උන්වහන්සේට හැමදාම ස්තූති පුදන්න. |